# මංගල සූත්‍රය

සුමනසිරි ලියනගේ

දේශපාලනය වෘත්තියක් ලෙස අපට කැප දෙයක් නොවේ. මා වාමාංශික පක්ෂයක සාමාජිකයෙකුව සිටි අවධියේ වෘත්තීය දේශපාලකයෙකු වීමට මා සූදානම් විය යුතුයැයි යෝජනා කෙරින. ලෙනින් ගේ වාත්තීය විප්ලවවාදියෙකු වීමේ අවශ්‍යතාවය මා එවකට විශ්වාස කලද මා හැම විටම තැත්කලේ එයින් කර ඇරීමට ය.  මේ නිසා මගේ සහෝදර පාක්ෂිකයන් මා හැඳින්වූයේ කැකුලු හාලේ බත් කන සුලු ධනේශ්වර බුද්ධිමතෙකු හැටියට ය.  එම හැඳින්වීම එවකට මෙන්ම අද ද නිවැරදි එකකි. මම කැකුලු හාලේ බත් කෑමට කැමැත්තෙමි. මා වෘත්තිය වශයෙන් ගත්විට අයත් වන්නේ සුලු ධනේශ්වර පන්තියට ය. මා බුද්ධිභාවයෙන් යුතු කෙනෙකුයි යන්න ගැන මට ආත්ම විශ්වාසයක් ඇත. වෘත්තියෙන් දේශපාලනඥයෙකු වීම මට අකැප වුව ද මා දේශපාලන සමාජයට අයත් කෙනෙකු යැයි මම සිතමි. මංගල සමරවීර ගේ බිඳීම හා වෙනම දේශපාලන ධාරාවක් හැටියට මතුවීමට හෝ ගන්නා උත්සාහය මෙම නිමේශයේ වැදගත් සංසිද්ධිය කැයි මට සිතේ.

මංගල ගේ අභිනිෂ්ක්‍රමණය සැලකිය යුතු ආකාරයකින් ප්‍රේමදාස ජනාධිපති සමයේ දී ලලිත් හා ගාමිණිගේ එක්සත් ජාතික පක්ෂයෙන් වෙන්වීම හා සමාන වේ. ලලිත් හා ගාමිණිගේ එක්සත් ජාතික පක්ෂයෙන් වෙන්වීම මෙන්ම මෙයින් ද කිසියම් ප්‍රභූ කැරැල්ලක් ගම්‍ය වන්නේ ය. කොළඹ ප්‍රභූ පැලැන්තියෙන් පිට කෙනෙකු රාජත්වයට පත්වීම මෙරට දේශපාලන සමාජයට මෙන්ම සිවිල් සමාජට ද උහුලා ගැන්මට පහසු දෙයක් නොවේ. එහෙත් කොළඹ ප්‍රභූ පැලැන්තියෙන් පිට කෙනෙකු රාජත්වයට පත් වූ විට ඔවුනට රාජ්‍යකරණයද ගැටලුවක් වන්නේ ය. මහින්ද රාජපක්ෂ රාජ්‍ය පාලනය දකින්නේ මැද මුලනේ සුරුට්ටු කඩයක පාලනයට සමාන එකක් හැටියට යැයි යමෙකුට ඒත්තු යන්නට කරුණු කාරණා නැත්තේ නොවේ. එය සාටෝපය පිළිබඳ ප්‍රශ්නයක් ම නොවේ. ප්‍රභූ ප්‍රතිරෝධය මෙම කැරලිවල දැකිය හැකි වුවද එම කැරලි වඩා වැදගත් රාජ්‍ය පාලනය සම්බන්ධ ගැටලුවක් මතු කරන්නේ ය.  මහින්ද රාජ්‍ය පාලකයෙකු ලෙස අසාර්ථක වන්නේ හෙතෙම සරම බැනියම අඳින නිසා නොව හේ පටු කෙනෙහිලි

දේශපාලනයක් කරන නිසාය. මෙතරම් බලයක් ඇතද අවිශ්වාසය තම වැඩ රාමුව කරගත් නිසා ය. මෙරට පාලකයන් අගර සිටි දෙමල ජනයාට වඩාත්ම සතුරු පාලකයා බවට හේ අද පත්ව ඇත්තේ ය.

මංගල සමරවීර තරුණ දේශපාලනඥයින් අතර පැහැදිලි පර්යාලෝකයක් ඇත්තෙකි. එම ගණයට දැමිය හැකි අනෙක් අය වන්නේ මිලින්ද මොරගොඩ සජිත් ප්‍රේමදාස හා නවීන් දිසානායකය. තම පටු න්‍යායයාත්මක සංරචකයෙහි හිර නොවන්නේ නම් අනුර කුමාර දිසානායක මෙම ගොඩට දැමිය හැක්කෙයි මට සිතේ. අනුර කුමාර දිසානායකට හැර මෙම හැම කෙනෙකුටම ඊට ඉහල පරම්පරාවේ බෙලි කැපිලි බාධකයක් ය. මා මීට පෙර සමාජ ප්‍රජාතන්ත්‍රවාදය හා තෙවන මග ගැන සාකච්ඡා කලෙමි. මෙම සන්දර්භය තුල මංගල විසින් මෙයට පෙර ඉන්දියාවේ දී කල දේශනය මා සිත් ගත්තේ ය. තෙවන මග මෙරට යහමගට යැවිය හැකි එක් මගක් යැයි මම සිතමි. අනෙක් මා ඇත. එහෙත් මා අදහන දහමට අනුව එම මං හා මට එකග විය නොහැක. තෙවන මග තරමක් දුශ්කර එකකි. ඒ එහි ඇති පටලැවිලි සහිත සංකීර්නත්වය නිසා නොව විවිධ තෙරපීම් නිසා එම මගෙන් බොහෝ අය වෙන මාවත් වලට තල්ලු වී යන නිසා ය. මෙයට කදිම උදාහරණය වන්නේ එක්සත් රාජධානියේ අගමැති කමට පත් ටෝනි බ්ලෙයාර් ය. තෙවන මගට ගමන් ඇරඹූ හේ නැවතුනේ බුෂ් ගේ රූකඩයක් බවට පත් යුද වාදියෙකු හැටියට ය.

මෙම තත්ත්වය ලලිත්-ගාමිනී වර්ගයේ පෙරලියක අවශ්‍යතාවය මතු කරයි. තෙවන මාවත ගැන මම පසුව ලියන්නෙමි. එහි අදට ඇති වැදගත්කම ගැන ප්‍රශ්නයක් නැත. නාගර්ජුන ගේ සිට ඇන්තනි ගිඩන්ස් දක්වා විවිධ දාර්ශනිකයන් ඒ ගැන ලියූ දෑ බොහෝ ය. කෙසේ වුවද මංගලට ලලිත්-ගාමිනී ගෙන් ඉගෙන ගත යුතු දෑ කිහිපයකි. එක්සත් ජාතික පක්ෂයෙන් අස්ව ගිය ඔව්හු වෙනම පක්ෂයක් ගොඩ නගා ගත්තේ ය. මා මෙහිදී මතු කරන්නේ නම පිලිබද ප්‍රශ්නයක් නොවේ. තම දේශපාලන ධාරාවේ ස්වාධීනත්වය රැක ගන්නට එම දෙපොල උත්සාහ කලහ. පක්ෂයක් බලය කරා මෙහෙයවීම පහසු කරුණෙක් නොවේ. එහිදි සන්ධාන අවශ්‍ය ය. එහෙත් සන්ධාන ප්‍රයෝජනවත් වන්නේ තම ස්වාධීනත්වය රැක ගැන්මෙන් ය. මංගල දිනා ගැන්මට තැත් කරන එක් තීරුවක් වන්නේ

වර්තමාන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කොටස් ය. මෙතෙක් දේශපාලන පක්ෂ ගත නොවුනු විශාල පිරිසක් ගොනු කර ගැන්මේ විභවයක් ඔහුට ඇත. මෙම කටයුත්ත සාර්ථකව කර ගැන්මට නම් හෝ රනිල් වික්‍රමසිංහ ගේ එක්සත් ජාතික පක්ෂය සමග සැලකිය යුතු දුරස්ථ භාවයක් පවත්වා ගත යුතු ය. එසේ නැත්නම් මංගල ගේ තෙවන මගට විය හැක්කේ ටෝනි බ්ලේයාර් ගේ තෙවන මගට වූ දෙයම ය. එක්සත් ජාතික පක්ෂයේ කැඩී ගිය කොටස තෙවන මගට වඩා ආසන්න කරගත හැකි පිරිස ලෙස මම දකිමි.

ප්‍රමාණයෙන් කුඩා ජාතික පක්ෂ සමග හේ ඇති කර ගන්නට යන සන්ධානය මා දක්න්නේ ධනාත්මක එකක් ලෙස ය. මංගලගේ සිහිනයේ අභියොගයේ එක් දුර්වල කොටසක් වන්නේ ජාතික ප්‍රශ්නය පිලිබඳ කොටස ය. එහෙත් සති අන්ත ඉංග්‍රීසි පුවත් පතකට දුන් සම්මුඛ සාකච්ඡාවේ දී හේ වඩා පැහැදිලි හා නිවැරදි ලෙස තම ස්ථාවරය ඉදිරිපත් කර තිබිනි. අපට අද සිහින දැකිය හැකි හා සිහින අභියෝගයක් කර ගන්නා දේශපාලනයක් අවශ්‍ය ය.  මා මීලග සටහනෙන් තෙවන මාවත ගැන න්‍යායාත්මකව සාකච්ඡා කරන්නට බලා පොරොත්තු වෙමි.